WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2015

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

## උත්තරපත්‍ර ලකුණු කිරීම - පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතු වේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

- ❖ උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
- ❖ සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී **පැහැදිලි ඉලක්කමින්** ලියන්න.
- ❖ ඉලක්කම් ලිවීමේ දී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලි ව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

### බහුවරණ උත්තරපත්‍ර (කවුළු පත්‍රය)

ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදි ව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන/අතිරේක ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

අනතුරු ව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එක ම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවක දී පැහැදිලි ව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදි ව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර ✕ ලකුණකින් ද වරණ තීරය අවසානයේ ලකුණු කරන්න. නිවැරදි ලකුණු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරය පහළින් ලියා දක්වන්න. අනතුරු ව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවල දී පරිවර්තිත ලකුණු ලියා ඒ වටා රවුමක් අඳින්න.

උදා : $\frac{60}{100}$ $\frac{20}{30}$

### ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර

- ❖ අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස් ව තබා ඇති කොටස් පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.
- ❖ ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

කිසියම් අයදුම්කරුවකු විෂයයට නියමිත ප්‍රශ්නපත්‍ර එකකට පමණක් පෙනී සිටි අවස්ථාවක දී (ප්‍රශ්නපත්‍ර තුනක් ඇති විෂයයන් හි එකකට හෝ දෙකකට) ඉතිරි ප්‍රශ්නපත්‍රයට හෝ ප්‍රශ්න පත්‍රවලට ඔහු නොපැමිණි බව විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන්ව තිබේ නම්, නොපැමිණි පත්‍රවලට අයදුම්කරු ලබා ඇති ලකුණු 00 ක් සේ සලකා එම අයදුම්කරුගේ අවසාන ලකුණු තීරණය කළ යුතු ය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

උදාහරණ : මුළු ලකුණු 100

| අවසාන ලකුණු 100 | මුළු ලකුණු 100 | I පත්‍රය 40 | II පත්‍රය 60 |
|---|---|---|---|
| 44 | 44 | AB | 44 |

| අවසාන ලකුණු 100 | මුළු ලකුණු 200 | I පත්‍රය 100 | II පත්‍රය 100 |
|---|---|---|---|
| 31 | 62 | 62 | AB |

අවසාන ලකුණු තීරණය කළ නොහැකි අවස්ථා

* කිසියම් විභාග මධ්‍යස්ථානයකට අයත් ඔබ ලකුණු කරන විෂයයේ I හෝ II උත්තරපත්‍ර පැකැට්ටුවලින් එක් පැකැට්ටුවක් ඔබ මණ්ඩලය වෙත ලැබී නොමැති නම් අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

  (උදා - ගණිතය විෂයය සඳහා ගණිතය I හා II වශයෙන් ප්‍රශ්න පත්‍ර දෙකක් තිබේ. එහෙත් අංක 10 දරන විභාග මධ්‍යස්ථානයෙන් ඔබ මණ්ඩලය වෙත ලැබී ඇත්තේ ගණිතය II උත්තර පත්‍ර පැකට්ටුව පමණි.)

* කිසියම් අයදුම්කරුවකුගේ I හෝ II හෝ III හෝ උත්තරපත්‍රවලින් 01 ක් හෝ 02 ක් හෝ පැකැට්ටුව තුළ නොමැති අවස්ථාවක දී, ඔහු එම ප්‍රශ්න පත්‍රයට හෝ පත්‍රවලට නොපැමිණි බව ශාලාධිපති විසින් විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන් කර නොමැති අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

* කිසියම් අයදුම්කරුවකුගේ උත්තරපත්‍රයේ සඳහන් විභාග අංකය හා ලකුණු ලැයිස්තුවේ සඳහන් විභාග අංකය නොසැසඳෙන අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

* කිසියම් මධ්‍යස්ථානයක සියලු ම අයදුම්කරුවන්ට පොදු වශයෙන් බලපා ඇති වරදක් සිදු වී ඇති අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

  උදා - ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන, කඩදාසි දෙකකින් හෝ කිහිපයකින් සමන්විත ප්‍රශ්න පත්‍රයක් ඇති අවස්ථාවක විභාග අපේක්ෂකයින්ට එක් කඩදාසියක් හෝ කිහිපයක් අඩුවෙන් දී ඇති අවස්ථා

**මෙවැනි අවස්ථාවල දී**

අවසාන ලකුණු තීරණය නොකර ලකුණු ලැයිස්තුවේ වෙනත් කරුණු තීරයේ අයදුම්කරුගේ විභාග අංකය ලියා **"අවසාන ලකුණු තීරණය කළ නොහැක"** යන සටහන යොදන්න. මෙම සටහන උත්තරපත්‍රයේ මුල් පිටුවේ පහළ කෙළවරේ ද යොදන්න. මේ පිළිබඳ ව ජර්නල් සටහනක් යොදන්න.

මෙවැනි අයදුම්කරුවන් පිළිබඳ මධ්‍යස්ථාන අනුව වෙන් වශයෙන් (9IML) අසම්පූර්ණ ලකුණු ලැයිස්තු පිළියෙල කරන්න.

මෙම ලකුණු ලැයිස්තු 9IML කවරය තුළ බහා ඇගයීම් මධ්‍යස්ථාන පරිපාලකට භාර දෙන්න.

එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

ප්‍රශ්න අංක 03 - (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$



WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු වේ. සියල්ල ම ලකුණු කොට ලකුණු මුල් පිටුවේ සටහන්කර අවසානයේ දී ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනි ව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

පරීක්ෂාකාරී ව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකට ම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ගණන ඔබ විසින් මුල් පිටුවේ එකතු කර ඇති මුළු ගණනට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න. ඒ ඒ ප්‍රශ්න පත්‍රයට ලබා ඇති ලකුණු ප්‍රතිශතයක් වශයෙන් දැක්විය යුතු අවස්ථාවල දී එසේ දක්වන්න.
(ඇතැම් ප්‍රශ්න පත්‍රවලට නියමිත ලකුණු ගණන හා ප්‍රතිශතය සමාන වන අතර, ඇතැම් ඒවායේ නියමිත ලකුණු හා ප්‍රතිශතය වෙනස් වේ.)

### අවසාන ලකුණු තීරණය කිරීම

දින පැකැට්ටුවට අදාළ සියලු ම උත්තරපත්‍ර එනම් I හා II (ඇත්නම් III) උත්තර පත්‍ර ලකුණු කර අවසාන වූ පසු එම උත්තරපත්‍රවලට අදාළ ලකුණු අයදුම්කරුගේ II පත්‍රයේ මුල් පිටුවේ සටහන් කරන්න.

උදාහරණ :

| (අ) | | (ආ) | | (ඉ) | |
|---|---|---|---|---|---|
| (i) | $\frac{54}{100}$ | (i) | $\frac{22}{40}$ | (i) | $\frac{60.5}{100}$ |
| (ii) | $\frac{67}{100}$ | (i) | $\frac{34}{60}$ | (i) | $\frac{81}{100}$ |
| (iii) | $\frac{36}{100}$ | | | | |
| 3 | 157 | | | 2 | 141.5 |
| | 52.33 | | | | 70.75 |
| | 52% | | 56% | | 71% |

WWW.OLEVELAPI.COM

ඉහත උදාහරණවලින් දැක්වෙන පරිදි දශම සංඛ්‍යා ලැබෙන අවස්ථාවල දී අවසාන ලකුණු පමණක් පූර්ණ සංඛ්‍යාවක් ලෙස දක්වන්න. අවසාන ලකුණු ප්‍රතිශතයක් වශයෙන් පූර්ණ සංඛ්‍යාවක් ලෙස දැක්වීමේ දී ඉතිරිය 0.5 හෝ ඊට වැඩි නම් ඊළඟ පූර්ණ සංඛ්‍යාවට පැමිණවිය යුතු ය. ඉතිරිය 0.5ට අඩුනම් නොසලකා හැරිය යුතු ය. අවසාන ලකුණු ලෙස සැලකෙන්නේ එක් එක් අයදුම්කරුවන් එම විෂයයේ සෑම ප්‍රශ්න පත්‍රයකට ම ලබා ඇති ලකුණුවල ප්‍රතිශතයයි. අවසාන ලකුණු II පත්‍රය මත අකුරින් ද ලියා දක්වන්න.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM



# අභිමතාර්ථ
## I පත්‍රය
## 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න හතළිහකින් සමන්විත වේ. මෙහි දී අපේක්ෂකයින්ගේ අවබෝධය, ස්මරණය, නිරවුල් දැනුම, භාෂා පරිචය හා භාවිතය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් අපේක්ෂා කෙරේ.

## II පත්‍රය

මෙය ප්‍රශ්න පහකින් සමන්විත වෙයි. 1 ප්‍රශ්නය කෙටි උත්තර අපේක්ෂිත ප්‍රශ්න 10 කින් යුක්ත වෙයි. මෙහි දී සිංහල භාෂාවේ වචන කෝෂය ව්‍යාකරණ ආදිය පිළිබඳ දැනුම අපේක්ෂා කෙරේ. 2 ප්‍රශ්නය රචනා ලිවීමේ හැකියාව මැන බලන්නකි. දී ඇති රචනා මාතෘකා හතරෙන් එකක් යටතේ රචනාවක් ලිවීමත්, යෝග්‍ය මාතෘකාවක් යෙදීමත් අපේක්ෂා කෙරේ. මෙහි දී අපේක්ෂකයාගේ නිර්මාණ හා චින්තන ශක්තිය, ලේඛන කුසලතාව, නිරවුල් භාෂා භාවිතය, සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැන බැලීම ආදි අරමුණු කෙරෙහි අවධානය යොමු වෙයි.

3 ප්‍රශ්නය සාරාංශකරණය යි. දී ඇති ඡේදයක් සංක්ෂේප කොට ලියා දැක්වීම මෙහි දී අපේක්ෂා කෙරේ. අපේක්ෂකයින්ගේ සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මෙන්ම භාෂා භාවිතය පිළිබඳ දැනුම ද මෙහිදී පරීක්ෂා කෙරේ.

4 ප්‍රශ්නය අපේක්ෂකයින්ගේ භාෂා ඥානය හා අවබෝධය පරීක්ෂා කෙරෙන්නකි. මේ සඳහා නිර්දිෂ්ට ඡේදයක් ආශ්‍රයෙන් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ. මේ ප්‍රශ්න මනාව අවබෝධ කරගෙන නිවැරදි පිළිතුරු ලිවීම අපේක්ෂිත යි.

5 ප්‍රශ්නයේ දී අපේක්ෂකයින් විවිධ ලේඛන ලිවීමේ දී දක්වන දක්ෂතාව, ප්‍රායෝගික ලේඛන කුසලතාව විමසා බැලේ. මෙහි එක් ප්‍රශ්නයක් වන්නේ අත් පත්‍රිකාවක් සැකසීමයි. එහිම අනෙක් ප්‍රශ්නය වනුයේ පුවත්පත් වාර්තාවක් පිළියෙල කිරීම යි. මෙබඳු ප්‍රශ්න මගින් නූතන සමාජයෙහි විවිධ ප්‍රායෝගික ලේඛන පිළිබඳ අධ්‍යයනය හා ඒවා සිත්ගන්නා පරිදි ලියා දැක්වීමත් පිළිබඳ අපේක්ෂකයින්ගේ කුසලතාව විමර්ශනය කෙරේ.

## III පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් සමන්විත වෙයි. 1 ප්‍රශ්නයේ කොටස් දහයකි. මෙහිදී නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයින්ගේ අවබෝධය පරීක්ෂා කෙරේ.

2 ප්‍රශ්නය යොමුවන්නේ නිර්දිෂ්ට ග්‍රන්ථවල යෙදූ භාෂාවේ අර්ථාවබෝධය පිළිබඳ අපේක්ෂකයින් සතු දැනුම පරීක්ෂා කිරීමටයි. 3, 4 ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයින්ගේ විශ්ලේෂණාත්මක දැනුම පරීක්ෂා කිරීම සඳහා යොමුවෙයි.

5,6,7 ප්‍රශ්නවලින් අපේක්ෂකයින් පිළිතුරු සැපයිය යුත්තේ එකකට පමණි. මෙහි අභිමතාර්ථය වනුයේ නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රිතව අපේක්ෂයින් තුළ පවත්නා විශ්ලේෂණාත්මක, විචාරාත්මක හා තර්කානුකූල දැනුම මැන බැලීමයි.

සමස්තයක් වශයෙන් සැලකීමේ දී සිංහල I, II හා III ප්‍රශ්න පත්‍ර අපේක්ෂකයින්ගේ භාෂා ඥානය හා සාහිත්‍යාවබෝධය පරීක්ෂා කිරීම සඳහා යොමු වන බව සඳහන් කළ යුතුය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 | S | I,II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்**
**General Certificate of Education (Ord. Level) Examination, December 2015**

| | | |
|---|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය | I, II | පැය තුනයි |
| சிங்களமொழியும் இலக்கியமும் | I, II | மூன்று மணித்தியாலம் |
| Sinhala Language and Literature | I, II | *Three hours* |

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති **(1), (2), (3), (4)** උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තදකළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන වචනය තෝරන්න.

**1.** **උඩක් බිමක් නොබලා** වැඩ නොකරන්නැයි ගුරුතුමා තම ශිෂ්‍යයාට අවවාද කළේ ය.
(1) වැඩිහිටි අවවාද නොතකා (2) අනුන්ගේ උපදෙස්වලින් තොරව
(3) කිසිවක් සොයා නොබලා (4) වටපිට නොබලා

**2.** සුමල්, ප්‍රදේශයේ ප්‍රචලිත ව ඇත්තේ **අනුන්ට ගිනි දෙන** කෙනකු ලෙසිනි.
(1) විපත් ඇති කරන (2) මුදල් ලබා දෙන
(3) ගින්දර ලබා දෙන (4) උදවුපදවු කරන

**3.** පසුගිය කාලයේ සිදු වූ දේවල් නිසා ඔහුගේ **තටු කැඩී ඇති බව** ගම්වැසියෝ පැවසූහ.
(1) මනස විකෘත වී (2) දුප්පත් වී
(3) අසනීප උග්‍ර වී (4) බලය පිරිහී

● අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

**4.** ලෝකප්‍රකට ක්‍රීඩිකාවක තමා අසල සිටිනු දුටු අමාලි .............................. පත් විය.
(1) වික්ෂිප්තභාවයට (2) සංකුලතාවට (3) සංවේදීභාවයට (4) සුරක්ෂිතතාවට

**5.** සාගරයේ රාත්‍රිය ගොඩබිමට වඩා .............................. ලෙසින් අලංකාර ය.
(1) අසදෘශ (2) පරිමිත (3) අපරිමිත (4) විස්මිත

**6.** මාර්ටින් වික්‍රමසිංහ සූරීන් සිංහල සාහිත්‍යයට කළ .............................. සේවය පැසසිය යුතු ය.
(1) වන්දනීය (2) සම්භාවනීය (3) අභිභවනීය (4) අනභිභවනීය

**7.** අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) උෂ්ණත්වය, ඌෂ්මාක්ෂර, උල්ලංඝනය, උපදේශක
(2) කඩොලාන, කණ්ඩිය, කණිසම, කම්පනය
(3) ගාන්ධර්ව, ගිනිකොන, ගිම්හානය, ගුණධර්ම
(4) නිධානය, නිබන්ධනය, නැණසල, නේපථ්‍යාගාරය

**8.** සෑම පදයක ම අක්ෂර වින්‍යාසය **නිවැරදි ව** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) මධ්‍යස්ථානය, තාක්ෂනය, අළුත්වැඩියාව, පළපුරුද්ද
(2) කළමණාකරු, විශ්වසනීය, වාච්‍යාර්ථය, ජනශ්‍රැණ්‍ය
(3) ශ්‍රේෂ්ඨ, පරිනාමය, පර්යේෂණ, අබිරුචිය
(4) අභිමත, සමීපස්ථ, පෙළපාලිය, ළයාන්විත



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**9.** **අන්‍යාර්ථ සමාසයට** උදාහරණයක් වන්නේ,
(1) නැඟෙනහිර ය. (2) පාපියුම් ය. (3) ඉම්බිරි ය. (4) කෘම්භානි ය.

**10.** 'ඔවුහු දරුවන්ගේ කෙළිසෙල්ලම් බලා සතුටු වූහ.' යන වාක්‍යයේ **කෙළිසෙල්ලම්** යනු,
(1) තද්ධිත පදයකි. (2) සර්වනාම පදයකි.
(3) යුගල පදයකි. (4) කෘදන්ත පදයකි.

**11.** **උක්ත නාමපද** පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) ක්‍රීඩිකාවක, මිනිස්සු, ශිෂ්‍යයෝ, නුඹ (2) අපි, තරුණයෝ, ළමයෙක්, නිලධාරිහු
(3) මම, වනමංගයෝ, ගායිකාවක, තරුණයෙක් (4) ගායකයෙක්, අපේක්ෂකයන්, ඇතැමෙක්, පියාණෝ

**12.** **උපසර්ගයක්** රහිත පදයක් ඇති වරණය තෝරන්න.
(1) නිෂ්ප්‍රභ, පරදේශ, අයැදුම්, නිදුක් (2) ප්‍රතිඵල, පරිභ්‍රමණය, අභිනික්මන, අධිභාරය
(3) අනුකම්පුව, අන්ධකාර, නිර්ලෝභී, විසම (4) අවප්‍රමාණය, සදහම්, සංවර්ධනය, ඉමහත්

**13.** "සම්පූර්ණයෙන් විනාශ කිරීම" යන්න සඳහා යෙදිය හැකි **තනි පදයක්** දැක්වෙන වරණය කුමක් ද?
(1) වියෝජනය (2) විසංයෝජනය
(3) වීමංසනය (4) විධ්වංසනය

● අංක **14** සිට **16** තෙක් ප්‍රශ්නවල **තදකළ අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

**14.** සීගිරි ගී ලියූවන් අතර **විදග්ධ** කවීන් සිටි බව කියැවේ.
(1) විදේශීය (2) විශේෂ (3) නිපුණ (4) ප්‍රසිද්ධ

**15.** **යථෝක්ත** කාරණය පිළිබඳ ව සැලකිලිමත් වන ලෙස නිලධාරියා තම සේවකයන්ට දැන්වී ය.
(1) දන්වන ලද (2) කීමට අපේක්ෂා කරන
(3) ඉහත කියන ලද (4) විශේෂයෙන් කියන ලද

**16.** හොඳ සාහිත්‍ය නිර්මාණයක් බිහිවීමට සාහිත්‍යකරුවා තුළ **ව්‍යුත්පත්තිය** ද තිබිය යුතු ය.
(1) උචිත අනුචිත දේ තෝරා ගැනීමේ හැකියාව (2) අලුත් දේ නිර්මාණය කිරීමේ හැකියාව
(3) නිරන්තරව කරන අභ්‍යාසය (4) අත්දැකීම් බහුල වීම

**17.** මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් **නො වන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) කෘදන්ත - නැටුම, ගයන්නේ, තොටිල්ල, පැවිල්ල
(2) සර්වනාම - අපි, එතුමා, ඔබ, ඔහු
(3) නිත්‍ය බහුවචන - ඇතැමෙක්, කෙනෙක්, අයෙක්, සමහරෙක්
(4) ක්‍රියා විශේෂණ - සෙමෙන්, වේගයෙන්, උවමනාවෙන්, අමාරුවෙන්

**18.** පූර්වස්වර ලෝප සන්ධියට උදාහරණයක් **නො වන** පදය තෝරන්න.
(1) දකුණත (2) මැදැඟිල්ල (3) දෑත (4) දිවැස

**19.** මුලින් දී ඇති පදයට සමානාර්ථයක් **නො දෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ආලෝකය - අලු, ප්‍රභා, පහන්, කාන්ති (2) කැලෑව - වල, අරණ, ළන්ද, රුකුල
(3) පොකුණ - විල, තඩාග, සරසි, තළා (4) ප්‍රසිද්ධ - පසිඳු, විශද, පළ, ලකළ

**20.** **විරුද්ධාර්ථවත්** පද යුගලයක් **නො වන** වරණය තෝරන්න.
(1) ප්‍රපාතය – මස්තකය (2) සම්භාවනීය – නින්දනීය
(3) සංවෘත – ආවෘත (4) සාමූහික – ඒකල

**21.** **පූර්ව ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය තෝරන්න.
(1) හොඳින් පාඩම් කළහොත් විභාගය ජයගත හැකි වේවි.
(2) ක්‍රීඩකයා දුවද්දී ප්‍රේක්ෂකයෝ ඔල්වරසන් දුන්හ.
(3) ගායිකාව ගීයක් ගයමින් නර්තනයක යෙදුණා ය.
(4) මම පොත කියවා නිදාගත්තෙමි.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

22. වැරදි අදහස සහිත වරණය තෝරන්න.
(1) වෛකල්පික යනු අනිවාර්ය යන පදයෙහි විරුද්ධාර්ථ පදයයි.
(2) නිපාත, වාක්‍යවල මැද පමණක් යෙදී අර්ථ ප්‍රකාශ කරයි.
(3) අසිරිමත් යන පදයේ මත් යනු තද්ධිත ප්‍රත්‍යයකි.
(4) කව්සිළුමිණ යනු සමාස පදයකි.

23. **ඌෂ්මාක්ෂර** පමණක් ඇතුළත් වන වරණය තෝරන්න.
(1) ක, ශ, ස, හ, ග
(2) ච, ට, ප, ත, ද
(3) ෂ, ෆ, ස, ළ, ව
(4) ශ, ෂ, ස, හ, ෆ

- අංක **24** සිට **26** තෙක් දී ඇති ප්‍රස්තාව පිරුළුවලට **වඩාත් ගැළපෙන** අදහස සහිත වරණය තෝරන්න.

24. ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වගේ
(1) සාමූහික ව එක් වී යම් කාර්යයක් කිරීම
(2) අනුන් රවටීමට ගොස් තමන් ම රැවටීම
(3) අර්ථ විරහිත කාර්යයක් සිදු කිරීම
(4) උත්සාහය මගින් ජයග්‍රහණය ලැබීම

25. නැග්ග ඉනිමගට පයින් ගැසුවා වගේ
(1) උපකාර ලබාගත් පසු උපකාර කළ තැනැත්තා අමතක කිරීම
(2) උපකාර කළ පසු ප්‍රත්‍යුපකාර අපේක්ෂා නොකිරීම
(3) ධනවත් වූ පසු දුප්පත් මිනිසුන් අමතක කිරීම
(4) ඉහළ නිලතලවලට පත් වූ පසු අනෙක් අයට නොසැලකීම

26. ඇටිකෙහෙල් කෑ උගුඩුවා වගේ
(1) තමන් කළ වරද තමන්ට ම දැනීම
(2) නොදන්නා දේ කිරීමට ගොස් අමාරුවේ වැටීම
(3) තමන් කළ වැඩ ගැන පසුතැවීමට පත් වීම
(4) දැන දැන ම වැරදි කර තමන් ම විඳ වීම

- අංක **27** සිට **29** තෙක් ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය** තෝරන්න.

27. (1) අපි දක්ෂ දරුවන් වෙමු.
(2) අප දක්ෂ දරුවෝ වෙමු.
(3) අපි දක්ෂ දරුවෝ වෙමු.
(4) අප දක්ෂ දරුවන් වෙමු.

28. (1) දෙමාපියන් සියල්ලෝ ම රැස්වීමට සහභාගි වෙති.
(2) දෙමාපියන් සියල්ලන් ම රැස්වීමට සහභාගි වෙති.
(3) දෙමාපියෝ සියල්ලන් ම රැස්වීමට සහභාගි වෙති.
(4) දෙමාපියෝ සියල්ලෝ ම රැස්වීමට සහභාගි වෙති.

29. (1) ගුරුවරු ළමයි කැටුව චාරිකාව ගියහ.
(2) ගුරුවරුන් ළමයි කැටුව චාරිකාව ගියහ.
(3) ගුරුවරු ළමයින් කැටුව චාරිකාව ගියහ.
(4) ගුරුවරුන් ළමයින් කැටුව චාරිකාව ගියහ.

30. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට **වඩාත් නිවැරදි** ලෙස ලැබෙන වාක්‍යය තෝරන්න.
"අපි කතා කළා ම සමහර අය හිනා වුණා"
(1) අප කතා කළ විට සමහරු සිනාසුණහ.
(2) අපි කතා කළ විට සමහරෙක් සිනාසුණේ ය.
(3) අපි කතා කළ විට සමහරුන් සිනාසුණහ.
(4) අප කතා කළ විට සමහරුන් සිනාසුණහ.

31. පහත සඳහන් කවියේ **තදකළු** අකුරෙන් මුද්‍රිත පද සඳහා යෙදෙන අර්ථ පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

මෙ නිරිඳුගෙ දූ **සඳ**
උලකුඩය දේවී **සඳ**
සොමි ගුණෙනි පුත් **සඳ**
පවති සිරි **සඳ** සිරින් ඇම **සඳ**

(1) කාන්තාව, චන්ද්‍රයා, උතුම්, කල්හි
(2) කල්හි, උතුම්, චන්ද්‍රයා, කාන්තාව
(3) උතුම්, චන්ද්‍රයා, කාන්තාව, කල්හි
(4) කාන්තාව, උතුම්, චන්ද්‍රයා, කල්හි

32. රූපකයක් සහිත වරණය තෝරන්න.
(1) පාළොස්වක සඳ පායනු වැන්නේ
(2) දුනුකෙයියා මලක් වගේ දුරට පෙනෙනවා
(3) වී පැදුරෙන් ඉගිලී යන කුරුල්ලකු ලෙසින්
(4) අම්මා සඳකි මම ඒ ලොව හිරුය රිදී



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

- අංක **33** සහ **34** යන ප්‍රශ්නවල මුලින් ඉදිරිපත් කර ඇති පාඨ සඳහා **වඩාත් සමීප අර්ථය** දෙන වරණය තෝරන්න.

**33.** වැව මුල් කරගත් ජලාශ්‍රයකට විපතක් සිදු වේ නම් එය රටවැසි සියල්ලන්ට ම සිදු වන විපතක් වශයෙන් දූරාතීතයේ සිට ම සැලකිණි.
(1) ජල සම්පතට සිදු වන විපත් රටට ම සිදු වන විපතක් ලෙස අතීත කාලයේ දී සැලකිණි.
(2) වැවකට සිදු වන විපතක් රටවැසියන්ට සිදු වන විපතක් ලෙස සලකන්නට අතීත වැසියෝ පුරුදු වූහ.
(3) වැව මූලික කරගත් ජල සම්පතට විපත් සිදු වීම රටවාසීන්ට සිදු වූ විපතක් වශයෙන් අතීතයේ පටන් ම සැලකී ය.
(4) වැව මූලික කරගත් ජල සම්පතට හානි සිදු වීම රටට ම වූ හානියක් බව අතීත කාලයේ දී සැලකිණි.

**34.** මුල් වකවානුවේ සිට හත්වැනි සියවස තෙක් ලියැවී තිබෙන සෙල්ලිපි එක් ගණයකටත් එතැන් සිට ලියැවී ඇති සෙල්ලිපි තවත් ගණයකටත් ඒවායේ භාෂා ලක්ෂණ අනුව වෙන් කළ හැකි ය.
(1) සෙල්ලිපි වර්ගීකරණයකට ලක් කළ හැකි අතර එහි දී ඒවායේ භාෂා ලක්ෂණ සැලකිල්ලට ගැනේ.
(2) ලියැවුණු කාලය අනුව සෙල්ලිපි කොටස් දෙකකට වෙන් කළ හැකි අතර එහි දී සැලකිල්ලට ගෙන ඇත්තේ ඒවායේ භාෂා ලක්ෂණයි.
(3) සෙල්ලිපි ලියැවී ඇති කාලය අනුව භාෂා ලක්ෂණ දක්නට ලැබෙන අතර ඒවා කොටස් දෙකකට වර්ග කර ඇත.
(4) සෙල්ලිපි ලියැවී ඇති භාෂාවේ ස්වරූපය අනුව ඒවා වර්ග දෙකකට වෙන් කිරීමට හැකියාව ඇත.

**35.** බ්‍රාහ්මී සෙල්ලිපිවල 'නාඩිර' යනුවෙන් සඳහන් කර ඇත්තේ,
(1) පොල් ය. (2) පුවක් ය. (3) තල් ය. (4) කොස් ය.

**36.** පහත සඳහන් ජනකවියේ හතරවැනි පදය දී ඇති වරණ අතුරෙන් තෝරන්න.

"සිටිති පෙළින් පෙළ රන්තරු විලසට
ගනිති එරන් කැති දහසක් එමවිට
දමති එරන් කැති මාරුව අහසට
................................................"

(1) තළා පිඹිති දෙපසේ බෙර නදකොට
(2) වලා යටින් සඳ පැයූ විලසට
(3) බලා සිටිති රජු ඇවිදින් එතනට
(4) කපති ගොයම් අඟනෝ බැස කුඹුරට

**37.** "වෙසක් කැකුළු අතු අග හිඳ නටන විලාසේ
ඉරෙන් හඳෙන් සිරි විඳ විඳ රඟන විලාසේ"

'රේඛාව' චිත්‍රපටය සඳහා නිර්මාණය කරන ලද ඉහත සඳහන් පද ඇතුළත් ගීතයේ පද රචකයා,
(1) ලූෂන් බුලත්සිංහල මහතා ය. (2) ගරු මර්සලින් ජයකොඩි පියතුමා ය.
(3) මහගම සේකර මහතා ය. (4) සුනිල් දයානන්ද කෝණාර මහතා ය.

**38.** පහත සඳහන් පද්‍යාර්ධයෙහි අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

"සොඳුරු තුරුණු සියපත් සිය රස් වතුර
ඉඳුරු දෙසින් වැද නුබ ගඟ එත පැතිර"

(1) සුන්දර වූ තරුණ සූර්යයාගේ රශ්මිය නමැති ජලය නැගෙනහිර දිශාවෙන් ආකාශ ගංගාවට වැදී පැතිරෙන කල්හි
(2) සුන්දර වූ තරුණ සූර්යයාගේ රශ්මිය නමැති වතුර දිව්‍ය ලෝකය දෙසින් ආකාශ ගංගාව කරා පැතිර ගොස්
(3) සුන්දර වූ තරුණ නෙළුම් මල් සිය රශ්මි නම් ජලය නැගෙනහිර දිශාවෙන් විහිදුවා ආකාශ ගංගාව කරා පැතිර ගොස්
WWW.OLEVELAPI.COM
(4) සුන්දර වූ තරුණ නෙළුම් මල්වල පෙති ජලය මත පා කර දිව්‍ය ලෝකය දෙසින් ආකාශය කරා පැතිර යද්දී

**39.** "ලෝ දහමින් වැදෙනා රළු පහරින්
ගත සිත රිදෙනා කල තිතියෙන්
නැත ලොවේ අන් රසඳුනා
ආදරේ සේ සුව දෙනා"

යන ගී ඛණ්ඩය ඇතුළත් වන්නේ,
(1) මනමේ නාට්‍යයේ ය. (2) සිංහබාහු නාට්‍යයේ ය.
(3) වෙස්සන්තර නාට්‍යයේ ය. (4) නරිබෑනා නාට්‍යයේ ය.

**40.** වැවක් ජලයෙන් පිරීගොස් වාන් දමන අවස්ථාවේ වැවේ ජල පහර චණ්ඩ වන අතර එයින් වැවට සිදු වන විනාශය වළක්වා ගැනීමේ අරමුණින් වැවට අධිපති දෙවියන්ට බාර වී සිදු කරන පූජාව හැඳින්වෙන්නේ,
(1) මුට්ටි නැම්ල්ල නමිනි. (2) නානුමුරය නමිනි.
(3) නිහර වී පූජාව නමිනි. (4) වැවේ රාජකාරිය නමිනි.

* *



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2015
க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2015

| විෂයය අංකය<br>பாட இலக்கம் | 21 | විෂයය<br>பாடம் | සිංහල භාෂාව හා සාහිත්‍යය |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු

## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 2 | 21. | 4 | 31. | 3 |
| 02. | 1 | 12. | 3 | 22. | 2 | 32. | 4 |
| 03. | 4 | 13. | 4 | 23. | 4 | 33. | 3 |
| 04. | 1 | 14. | 3 | 24. | 2 | 34. | 2 |
| 05. | 3 | 15. | 3 | 25. | 1 | 35. | 1 |
| 06. | 4 | 16. | 1 | 26. | 4 | 36. | 4 |
| 07. | 3 | 17. | 1 | 27. | 3 | 37. | 2 |
| 08. | 4 | 18. | 3 | 28. | 4 | 38. | 1 |
| 09. | 1 | 19. | 4 | 29. | 3 | 39. | 2 |
| 10. | 3 | 20. | 3 | 30. | 1 | 40. | 3 |

WWW.OLEVELAPI.COM

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තර පත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | 25<br>40 | I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள் | 25<br>40 |
|---|---|---|---|



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
# II පත්‍රය

**ප්‍රශ්න අංකය 01**

**අපේක්ෂණය - භාෂා පරිචය ඇගයීම**

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. අනු ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ** නම්, එහි **අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් එක් එක් වචනවල අන්තර්ගත පිල්ලම් අනුපිළිවෙළින් ලියන්න.
**(අ)** තුරඟා **(ආ)** හිරු

(ii) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග **දෙකක්** ලියන්න.
විරූපී මිනිසකුගේ ජීවිතය ඇසුරෙන් තැනුණු අනුවේදනීය කතා පුවතක් පුවත්පතක දුටුවෙමි.

(iii) පහත සඳහන් **(අ)** සහ **(ආ)** යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනිපදය බැගින් ලියන්න.
**(අ)** එකිනෙකට සම්බන්ධ ව පවතින
**(ආ)** යම් ස්ථානයකට බලහත්කාරයෙන් කඩාවැදීම

(iv) පහත සඳහන් වාක්‍ය ඛණ්ඩවල **තදකළු** අකුරෙන් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
**(අ)** පොඩි නැන්දා **හිනාවෙවී** වෙලට ගෙනා මී කිරි
**(ආ)** ලොවට සාමය ***උදාවේවා***

(v) පහත සඳහන් වාක්‍යයේ වචන **දෙකක** අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන **දෙක** පමණක් නිදොස් කර ලියන්න.
"පොදු ජන සිතෙහි විද්‍යාව රෝපනය කිරීමේ ප්‍රශ්නය ගැන සැලකිල්ල යොමු වී තිබෙන මෙවැනි යුගයක මේ විශිෂ්ට ප්‍රයත්නයට ප්‍රසංශා කළ යුතු ය."

(vi) පහත දැක්වෙන **(අ)** සහ **(ආ)** යෙදුම්වල පළමුවැනි වචනය සමඟ දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.
**(අ)** මුහුදු බාදනය
**(ආ)** සොබා ධර්මය

(vii) පහත **(අ)** සහ **(ආ)** හි දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
**(අ)** නිලධාරී මණ්ඩලයෙන් එක් අයෙක් ඉල්ලා අස්වෙති.
**(ආ)** සමිතියේ සාමාජිකාවන් නොහොත් ආයතනයේ සේවිකාවෝ රැස්වීමට සහභාගි වෙති.

(viii) පහත දැක්වෙන පද සන්ධි කොට ලියන්න.
**(අ)** සත් + හස **(ආ)** ගිරි + අග

(ix) පහත සඳහන් පද්‍ය පාදයේ **තදකළු** අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.
**දලලඹ නිලඹ** ගැබ නැගි ගුම් අසාලා

(x) පහත දැක්වෙන යෙදුම් සඳහා වී ගොවිතැන ආශ්‍රිත භාෂා ව්‍යවහාරයෙහි යෙදෙන වචන ලියන්න.
**(අ)** කුරුල්ලන්ට කෑම පිණිස වෙන් කරන කුඹුරු කොටස
**(ආ)** කුඹුරක වටේට පස් සහ මඩවලින් සකස් කරන වැටිය

(ලකුණු 20 යි.)

WWW.OLEVELAPI.COM

i (අ) පාපිල්ල/කෙටි පාපිල්ල, ඇලපිල්ල
(ආ) ඉස්පිල්ල/කෙටි ඉස්පිල්ල, පාපිල්ල/කෙටි පාපිල්ල

ii වි, අනු/ විරූපී, අනුවේදනීය/ වි (රූපී) අනු (වේදනීය)

iii (අ) ඒකාබද්ධ/අනුබද්ධ/අනුබන්ධ/අවියෝජනීය / අනුබැඳි / ඝනබන්ධ
(ආ) ආක්‍රමණය

iv (අ) මිශ්‍ර ක්‍රියා/ මුසු කිරිය
(ආ) ආශීර්වාද ක්‍රියා/ ප්‍රාර්ථනා ක්‍රියා / ආසි කිරිය.

v රෝපණය, ප්‍රශංසා (වාක්‍යය ම ලියා තිබුණ ද නිවැරදි ය)

vi (අ) මුහුදු කෑම/ සමුද්‍ර බාදනය
(ආ) සොබා දහම/ ස්වභාව ධර්මය



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

vii (අ) නිලධාරි මණ්ඩලයෙන් එක් අයෙක් ඉල්ලා අස්වෙයි.
(ආ) සමිතියේ සාමාජිකාවෝ නොහොත් ආයතනයේ සේවිකාවෝ රැස්වීමට සහභාගි වෙති.

viii (අ) සන්නස
(ආ) ගිරග

ix වැහිවලාව/ වැහිවලාකුළ/ජලවාෂ්ප සහිත වලාකුළ
නිල් අහස/නිල් අඹර/නිල් වලාකුළු

x (අ) කුරුලු පාළුව
(ආ) නිරස/ වේල්ල/ මියර

**ප්‍රශ්න අංකය 02**

**අපේක්ෂණය - සංශ්ලේෂණ හැකියාව මැනීම**

මේ ප්‍රශ්නය සැකසීමේ දී අනුගමනය කර ඇත්තේ මාර්ගෝපදේශිත රචනා මූලධර්මය යි. එනම් ඉදිරිපත් කොට ඇති මග පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් කිසියම් රචනාවක් කිරීමට අපේක්ෂකයාට ඉඩ සැලැස්වීම යි. රචනයේ ඇතුළත් විය යුතු කරුණු, විස්තරය ඇසුරින් වටහා ගත යුතුය. රචනයෙහි විය යුතු ඡේද සංඛ්‍යාව ගැන වැටහීමක් දී ඇති විස්තරයෙන් ලබා ගත හැකිය. මාතෘකාව ඉදිරිපත් කොට නැතත්, ඉදිරිපත් කොට ඇති විස්තර ඇසුරින් මාතෘකාව සකස් කර ගැනීමට අපේක්ෂකයාට අවසර ඇත.

**2.** පහත දැක්වෙන **අ. ආ. ඉ. ඊ** යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන **වචන 250කට නොඅඩු** වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

(අ) අප දැනුමෙන් පරිපූර්ණත්වයට පත් කරන්නට සාහිත්‍ය පොතපත උපකාරී වෙයි. එහෙත් තාක්ෂණික ලෝකයේ අතරමංව සිටින වර්තමාන පරම්පරාව ක්‍රමයෙන් සාහිත්‍ය පොතපත පරිශීලනයෙන් ඈත් වෙමින් සිටිති. දිනෙන් දින සිය ගණනින් පොතපත පළ වුව ද ඒවා කියවන පිරිස සීමිත ය. මේ තත්ත්වය රටේ අනාගතය කෙරෙහි ඉතා අයහපත් ලෙස බලපායි. හිස් වූ මොළ ඇති මිනිසුන්ගෙන් පිරි රටක අනාගතය කෙබඳු වෙයි ද? ගුණධර්ම පිරි සමාජයක් කෙසේ අපේක්ෂා කළ හැකි දැ'යි යන්න අවිනිශ්චිත ය.

(ආ) රටක අනාගතය රඳා පවතින්නේ ළමා පරපුර මත ය. අනාගතයෙහි රට බබළවන්නේ ඔවුන් ය. එහෙත් වර්තමානයේ ළමා පරපුර අභාග්‍ය සම්පන්න ඉරණමකට මුහුණ දෙමින් සිටිති. දරුවන්ට සිදු වන විවිධ හිංසා, පීඩා, පැහැර ගැනීම්, අපයෝජන, මෙහෙකාර සේවයේ යෙදවීම්, අතරමං කර දැමීම් වැනි විවිධාකාර දේ ගැන නිරන්තරයෙන් අසන්නට ලැබේ. පිපෙන්නට වෙර දරන පුංචි මල් කැකුළු බඳු දරු පරපුර රැකගැනීම අප සියලු දෙනාගේ ම වගකීමකි. හෙට දවසේ වැඩිහිටියන් බවට පත්වන ඔවුන් ගුණධර්ම සපිරි සමාජයකට දායාද කිරීම අප සැමගේ ම යුතුකමකි.

(ඉ) ශ්‍රී ලංකාව ඉපැරණි ඉතිහාසයකට උරුමකම් කියන රටකි. අපේ පැරණි සංස්කෘතික දායාද සහ උරුම ඊට සාක්ෂ්‍ය සපයයි. අපේ අනන්‍යතාව සුරක්ෂිත වී ඇත්තේ එම පැරණි උරුමයන් මත ය. අනුරාධපුර, පොළොන්නරු ඇතුළු පැරණි රාජධානිවල ඇති නටබුන්වලින් අපේ පැරන්නන් සතුව තිබූ විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය පිළිබිඹු වේ. පැරණි සංස්කෘතික හරපද්ධතිවලින් අතීත ජනතාවගේ හැදියාව හා සදාචාරය පිළිබිඹු වේ. එහෙත් ශ්‍රී ලංකාව බාහිර ලෝකයට අදූරදර්ශී ලෙස නිරාවරණය වීමත් සමඟ අපේ පැරණි උරුමය හා සංස්කෘතිය ක්‍රමයෙන් විනාශ වෙමින් පවතී.

(ඊ) ජලය නොමැති තැනක මිනිසකුට එක් දිනක් හෝ ජීවත් වීම අසීරු ය. ජලය එතරම් ම මිනිස් ජීවිතය හා බැඳී පවතී. මිනිසා විවිධ කාර්යයන් සඳහා ජලය යොදා ගන්නා අතර බීමට ගැනීම එයින් ප්‍රධාන වේ. ලෝකයේ බීමට සුදුසු ජලය ඇත්තේ ස්වල්පයකි. එහෙත් පරිසර දූෂණය, කෘමිනාශක භාවිතය ආදිය නිසා මේ ස්වල්ප වූ ජල ප්‍රමාණය ද තවත් අඩුවෙමින් හා දූෂණය වෙමින් පවතී. දූෂිත ජලය පානය කිරීම නිසා වැළඳෙන වකුගඩු රෝග, පිළිකා ඇතුළු විවිධ මාරාන්තික රෝග ගැන නිතර අසන්නට ලැබේ. රටක පැවැත්මට නිරෝගී ජනතාවක් සිටීම අත්‍යවශ්‍ය ය. එබැවින් ජලය සුරැකීම පිළිබඳ ව පියවර ගත යුතු කාලය එළඹ ඇත.

(ලකුණු 25 යි)

(අ)
- ❖ ගුණධර්ම පිරි සමාජයක් උදෙසා සාහිත්‍යයේ උපයෝගිතාව
- ❖ ගුණධර්ම පිරි සමාජයක් සඳහා සාහිත්‍යයේ කාර්යභාරය
- ❖ දැනුම වර්ධනය සඳහා පොතපත පරිශීලනය



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(ආ) ❖ දරු පරපුරේ අනාගතය සුරැකීම
❖ දරු පරපුර රැක ගැනීමේ අවශ්‍යතාව
❖ සුරක්ෂිත ළමා ලෝකයක් බිහි කිරීම

(ඉ) ❖ අපේ පැරණි උරුමය රැක ගැනීම
❖ අපේ සංස්කෘතික දයාද රැක ගැනීම
❖ අපේ උරුමය හා සංස්කෘතිය රැක ගැනීම

(ඊ) ❖ ජල සම්පත සුරැකීම
❖ නිරෝගී දිවියක් සඳහා ජල සම්පත ආරක්ෂා කර ගැනීම
❖ මිනිස් දිවිය සුරකින ජල සම්පත

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25යි**

01. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළුව - ලකුණු 08යි
02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12යි
03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05යි

01. සාරවත්භාවය - ලකුණු 07යි
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01යි

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250 සමීප ව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12යි
මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදී අංශ ගැන සලකා බැලිය යුතුය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05යි
වියරණ, අත්අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

❖ සැලකිය යුතුයි

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දක්වූ 1, 2, 3 යන කොටස්වලට අනුපාතික ව ලකුණක් තීරණය කළ යුතු වේ.

02. වැදගත් අදහස්, සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (✓) යොදන්න. වැරදි තැන්වල (×) ලකුණු යොදන්න.

03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.
1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර, මුළු ලකුණු ගණන ලබා ගන්න.

නිදසුන් - $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්ෂය - වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යුහය කියවා දළ සැලැස්මක් සකස් කරගන්න. ව්‍යුහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ප්‍රශ්න අංකය 03**

**අපේක්ෂණය** - කිසියම් කොටසක් කියවා, විස්තර වර්ණනා බැහැර කරමින්, එහි හරය වටහා ගෙන, ඒ ඇසුරින් සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහි දී ඇගයේ. එසේ ම සංශ්ලේෂණ මෙන් ම විශ්ලේෂණ හැකියාව ද ඇගයීමට භාජනය කෙරේ.

3. පහත සඳහන් ඡේදය වචන **50 - 60** අතර වන සේ **සාරාංශ කොට ලියන්න**. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරය අග ලියන්න.

පෙරදිග සංස්කෘතියේ හරය දැක පෙරදිග භාෂා, දර්ශන, ජීවන ක්‍රමය, කලා ශිල්ප, අපරදිගවාසීන්ට හඳුන්වා දුන් ශාස්ත්‍රඥයෝ කීපදෙනෙක් වෙති. ඔවුන් තුළ පැවැති නිර්මාණ ශක්තියත්, මානව දයාවත්, අපූර්ව ඥාන සම්භාරයත් නිසා පෙරදිග සංස්කෘතික දායාද අපරදිග තවමත් බැබළෙමින් පවතී. ශ්‍රීමත් විලියම් ජෝන්ස් සංස්කෘත භාෂාව අපරදිගට හඳුන්වා දුන්නේ ය. ස්වාමි රාමක්‍රිෂ්ණ හා ස්වාමි විවේකානන්ද පෙරදිග දර්ශනයන්හි හරය බටහිර ලෝකයට ප්‍රකාශ කළහ. රබීන්ද්‍රනාත් තාගෝර් පෙරදිග සංගීතය හා සිතුවම් කලාව බටහිරට හඳුන්වා දුන් දූතයා විය. අනගාරික ධර්මපාලතුමා නිව්යෝර්ක් නුවර ලෝක ආගම් සමුළුවේ දී කළ ප්‍රකාශය, බෞද්ධ දර්ශනය අපරදිග පැතිරවීමේ පෙරවදනක් විය. ආනන්ද කුමාරස්වාමි පෙරදිග සංස්කෘතියෙහි හා කලාශිල්පවල උදාරත්වය ලොව හමුවේ අභිමානවත් ලෙස ඉදිරිපත් කරන්නට උත්සුක විය. අපේ සංස්කෘතියෙහි හරය දැක එය ලොවට දායාද කරනු වස් මධ්‍යකාලීන සිංහල කලා නමැති විශිෂ්ට ග්‍රන්ථය ඇතුළු අනර්ඝ ග්‍රන්ථ සම්භාරයක් ලියූ ආනන්ද කුමාරස්වාමි සූරීන් ඉමහත් කෘතවේදිත්වයකින් සැමරිය යුතු ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයෙකි. නුවර සමයේ පැවැති පෞරාණික ගොඩනැගිලි ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම අවධාරණය කළ කුමාරස්වාමි ඒ සම්බන්ධ ව ප්‍රසිද්ධ පුවත්පතකට ලිපියක් ලියමින් දේශීය ගෘහනිර්මාණ ශිල්පයේ අනන්‍යතාව තත්ත්වඥයන්ගේ අවධානයට හසු කළේ ය. මෙබඳු ගොඩනැගිලි පිළිබඳ ව කිසිවකුගේත් නෙත්සිත් යොමු නොවුණු වකවානුවක මේ සිදුවීම විශේෂයෙන් සැලකිය යුතු කරුණකි.

(ලකුණු 10 යි)

i පෙරදිග සංස්කෘතියේ හරය අපරදිගට හඳුන්වා දුන් විද්වත්තු කිහිපදෙනෙකි

ii ඔවුන්ගේ නිර්මාණ ශක්තිය, මානව දයාව හා දැනුම් සම්භාරය තවමත් බැබළෙමින් පවතී

iii සංස්කෘත භාෂාව, සංගීතය, කලාව, බෞද්ධ දර්ශනය හා සංස්කෘතිය එවැනි අංශ කිහිපයකි.

iv මෙරට සංස්කෘතිය ලෝකයට හඳුන්වා දුන් ආනන්ද කුමාරස්වාමි සුවිශේෂ විද්වතෙකි.

v ඔහු විසින් රචිත ''මධ්‍යකාලීන සිංහල කලා'' විශිෂ්ට සාහිත්‍ය කෘතියකි

vi ඔහුගේ ලේඛන දේශීය ගෘහ නිර්මාණ ශිල්පයේ අනන්‍යතාව විදහා දැක්වීමට සමත් විය

WWW.OLEVELAPI.COM

වචන ගණන 65 ඉක්මවන කල්හි සැලකිය යුත්තේ මුල් වචන 60 තුළ ඇති ප්‍රධාන අදහස් පමණි. වචන 45ට අඩු කල්හි එහි ඇතුළත් අදහස් ගණනය කොට ඊට සුදුසු අනුපාතික ලකුණක් පිරිනමන්න. උත්තරය ඡේදයක් සේ ලියා තිබිය යුතුය. කොටුවක් තුළ පද බෙදා තිබුණ ද පිළිගන්න. එක යට එක අසම්බන්ධිත වාක්‍ය වශයෙන් ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02 කි. වචන ගණනයේ දී ලිහිල් පිළිවෙතක් අනුගමනය කරන්න. වචන ගණන දළ වශයෙන් 65ට වැඩි කල්හි හෝ 45ට අඩුවන කල්හි වචන ගණන සඳහා ලකුණු 01 හෝ 02 හෝ පිරිනමන්න.

6/6 2/2 2/2 10/10



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ප්‍රශ්න අංකය 04**
**අපේක්ෂණය** - ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරින් අවබෝධ හැකියාව මැනීම.

4. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති **ප්‍රශ්නවලට උත්තර** සපයන්න.

සාගරය ගවේෂණය කිරීමේ දී මිනිසා මුහුණ දෙන බාධක කිහිපයකි. එයින් බලවත් ම බාධකය නම් සාගර ජලකඳ මගින් ඇති කරනු ලබන පීඩනය හෙවත් තෙරපුමයි. කිමිදුම්කරුවකුට ආරක්ෂා සහිත ව කිමිදෙන්නට හැකි වනුයේ අඩි 200–300 දක්වා ගැඹුරක පමණි. ඉන් ඔබ්බෙහි ඇති පීඩනය මිනිස් සිරුරට ඔරොත්තු නොදෙන්නකි. හිරු එළිය අඩුවීම, සාගර පතුලේ දී මිනිසාට මුහුණ පෑමට සිදු වන තවත් බාධකයකි. අඩි දසදහසකට වඩා ගැඹුරකට විහිදෙන මුහුදු ආගාධවලට හිරු එළිය නොලැබෙන තරම් ය. එබැවින් සියලු පරීක්ෂණ යාත්‍රාවලට මේ අන්ධකාරය විනිවිද යෑමට තරම් ප්‍රබල ආලෝකධාරා රැගෙන යෑමට සිදු වේ. 1955 දී න්‍යෂ්ටික බලයෙන් ක්‍රියාකරන ප්‍රථම සබ්මැරීනය වූ නෝටිලස් නිපදවන ලදී. මෙතෙක් කිසිවකුට ළඟා විය නොහැකි ව තිබූ උත්තරධ්‍රැවයේ හිම තට්ටුව යටින් ගොස් අනෙක් පසින් මතුවීමට නෝටිලස් සබ්මැරීනය මිනිසාට උපකාරී විය. එතෙකුදු වුවත් ශාන්තිකර සාගරයේ පිහිටි මැරියානා ආගාධය දක්වා මෙතෙක් ගමන් කර ඇත්තේ මිනිසුන් දෙදෙනකු පමණි. ඔවුහු ඒ සඳහා 'බැකිස්කාෆ්' නම් කුඩා විද්‍යාත්මක සබ්මැරීනයක් යොදාගත්හ.

(i) සාගර ගවේෂණයේ දී මිනිසා මුහුණ දෙන ප්‍රධානතම බාධකය කුමක් ද?
(ii) මිනිසකුට මුහුදේ අඩි 200–300කට වඩා ගැඹුරට කිමිදෙන්නට නොහැකි ඇයි?
(iii) මුහුදු පතුලට හිරු එළිය නොලැබීමේ බාධකය පරීක්ෂණ යාත්‍රා ජයගත්තේ කෙසේ ද?
(iv) නෝටිලස් සබ්මැරීනය උපකාරයෙන් මිනිසා කළේ කුමක් ද?
(v) ඉහත ඡේදයෙන් සාකච්ඡා කර ඇත්තේ කවර මාතෘකාවක් ගැන ද?

(ලකුණු 10 යි)

i. සාගර ජලකඳ මගින් ඇති කරන පීඩනය (තෙරපුම)

ii. පීඩනය මිනිස් සිරුරට ඔරොත්තු නොදෙන නිසා/ පීඩනය මිනිස් සිරුරට ඔරොත්තු නොදීම/ හිරු එළිය අඩු වීම (එක් උත්තරයක් තිබීම සෑහේ)

iii. අන්ධකාරය විනිවිද යෑමට තරම් ප්‍රබල ආලෝක ධාරා රැගෙන යෑම/ ප්‍රබල ආලෝක ධාරා රැගෙන යෑම

vi. උත්තර ධ්‍රැවයේ හිම තට්ටු යටින් ගොස් අනෙක් පසින් මතු වීම

v. සාගර ගවේෂණය/ සාගර ගවේෂණයේ දී මතු වන බාධා/ සාගර ගවේෂණයේ දී මතු වන බාධා ජය ගැනීම/ ආගාධ සාගර ගවේෂණය/ මුහුදු ආගාධය ජය ගැනීම/ මුහුදු පතුලට කිමිදීම

*(නිවැරදි උත්තරයකට ලකුණු 02 බැගින්)*

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ප්‍රශ්න අංකය 05**
**අපේක්ෂණය** - ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂයා සතු කුසලතා මැනීම

**5.** සිරිපුර ග්‍රාමෝදය සමිතිය මගින් ප්‍රදේශයේ තරුණ නාට්‍යකරුවන් සඳහා වැඩමුළුවක් සංවිධානය කර ඇත. වැඩමුළුව පැවැත්වෙන දිනය 2016 ජනවාරි මස 20 වන අතර වේලාව පෙ.ව. 9.00 සිට ප.ව. 7.00 දක්වා වේ. ප්‍රධාන අමුත්තා වශයෙන් ප්‍රවීණ නාට්‍යවේදී නයන කලාපති මහතා සහභාගි වීමට නියමිත ය. වැඩමුළුව අවසානයේ කෙටි නාට්‍ය තුනක් ද වේදිකාගත වේ. වැඩමුළුව පැවැත්වෙන ස්ථානය වශයෙන් තෝරාගෙන ඇත්තේ සිරිපුර යොවුන් රඟහලයි.

පූර්වෝක්ත වැඩමුළුව සඳහා සිරිපුර යොවුන් රඟහල ලබා දෙන මෙන් ඉල්ලා ප්‍රාදේශීය ලේකම්තුමා වෙත යැවෙන රාජකාරි ලිපිය ලියන්න. ග්‍රාමෝදය සමිතියේ ලේකම් කවිඳු උඩවත්ත ඔබ යැ'යි සිතන්න.

(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)

**නැතහොත්**

සිරිපුර එක්සත් සුබසාධක සංගමයට ආධාර ලබා ගැනීම පිණිස 2016 ජනවාරි මස 16 වැනි දින සිරිපුර යොවුන් රඟහලේ දී පියල් දමයන්තගේ 'මහසයුර කැළඹෙයි' නාට්‍යය පෙන්වීමට සැලසුම් කර ඇත. පෙ. ව. 10.30 හා ප. ව. 2.30 වශයෙන් දර්ශන වාර දෙකක් පැවැත්වෙන අතර 10.30 දර්ශනය පාසල් දරුවන්ට වෙන් කර ඇත.

ප. ව. 2.30 දර්ශනය නැරඹීමට ආරාධනා කරමින් සිරිපුර ප්‍රදේශීය ලේකම්තුමා වෙත යැවෙන ආරාධනා පත්‍රය සකස් කරන්න. සංගමයේ ලේකම් සඳරු වැලිවත්ත ඔබ යැ'යි සිතන්න.

(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.) (ලකුණු 15 යි)

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 05යි**

රාජකාරි ලිපිය
01. ආකෘතිය සඳහා ලකුණු 05 යි
02. අන්තර්ගතය සඳහා ලකුණු 07 යි
03. ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03 යි

01. ආකෘතිය සඳහා ලකුණු 05 යි

- යවන්නාගේ නම, ලිපිනය, දිනය ලකුණු 01
- ලබන්නාගේ ලිපිනය ලකුණු 01
- ආමන්ත්‍රණය ලකුණු 01
- මාතෘකාව ලකුණු 01
- තනතුර හා අත්සන ලකුණු 01

*ලිපිනයට උඩින් නම තිබුණත් පහළින් තිබුණත් ලකුණු දෙන්න

WWW.OLEVELAPI.COM

02. අන්තර්ගතය සඳහා ලකුණු 07 යි

අන්තර්ගත විය යුතු ප්‍රධාන කරුණු

| | | |
|---|---|---|
| 1 | වැඩමුළුවක් සංවිධානය කිරීම | ලකුණු 01 |
| 2 | වැඩමුළුවක් පැවැත්වෙන දිනය | ලකුණු 01 |
| 3 | ස්ථානය | ලකුණු 01 |
| 4 | වේලාව | ලකුණු 01 |
| 5 | ප්‍රධාන ආරාධිත අමුත්තා | ලකුණු 01 |
| 6 | කෙටි නාට්‍ය තුනක් පැවැත්වෙන බව | ලකුණු 01 |
| 7 | රඟහල ලබා දෙන ලෙස ඉල්ලීමක් කිරීම | ලකුණු 01 |

*(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 07 යි)*

කරුණු කොහොමක තිබුණත් ලකුණු දෙන්න



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

03. ශිල්පීය දක්‍ෂතා සඳහා ලකුණු 03යි

නිවැරදි අක්‍ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්‍ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

- ❖ නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.
- ❖ නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු 03 කි.

ආරාධනා පත්‍රය - ලකුණු 15යි

1, 2, 3 යන අංශ සඳහා ලකුණු වෙන් වෙන්ව දී ලකුණු එකතුව ලබාගන්න.

01. ආකෘතිය සඳහා ලකුණු 05යි
02. අන්තර්ගතය සඳහා ලකුණු 07යි
03. ශිල්පීය දක්‍ෂතා සඳහා ලකුණු 03යි

01. ආකෘතිය සඳහා ලකුණු 05 යි

| | |
|---|---|
| • කෙටි මාතෘකාව | ලකුණු 01 |
| • ආරාධනය කරන්නේ කවු ද? | ලකුණු 01 |
| • පළ කරන දිනය | ලකුණු 01 |
| • නිර්මාණශීලීභාවය | ලකුණු 02 |

02. අන්තර්ගතය සඳහා ලකුණු 07 යි

| | | |
|---|---|---|
| 1. | එක්සත් සුභසාධක සංගමයට ආධාර පිණිස | ලකුණු 01 |
| 2. | නාට්‍යකරුගේ හා නාට්‍යයේ නම | ලකුණු 01 |
| 3. | දිනය | ලකුණු 01 |
| 4. | ස්ථානය | ලකුණු 01 |
| 5. | දර්ශන වාර දෙකක් තිබෙන බව | ලකුණු 01 |
| 6. | පාසල් දර්ශන වේලාව | ලකුණු 01 |
| 7. | ප්‍රාදේශීය ලේකම්තුමාට ආරාධනා කිරීම | ලකුණු 01 |

WWW.OLEVELAPI.COM

03. ශිල්පීය දක්‍ෂතා සඳහා ලකුණු 03යි

නිවැරදි අක්‍ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්‍ෂණ, ඡේද වෙන්කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

- ❖ නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණුක් දෙන්න.
- ❖ නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු 03 කි.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
## III පත්‍රය

- ❖ **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.**
- ❖ **1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.**

**මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.**

මේ පත්‍රයේ දී නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳව අපේක්ෂකයාගේ අවබෝධය හා රසවින්දන හැකියාව ඇගයීමට භාජනය කෙරේ.

**ප්‍රශ්න අංකය 01**

**අපේක්ෂණය** - නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

**ලකුණු විග්‍රහය** - **මුළු ලකුණු 20යි**

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනු ප්‍රශ්නයක එක කොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) (අ) රාසුල් ජුගේ චරිතය ඇතුළත් කෙටිකතාවේ මුල් රචකයා නම් කරන්න.
(ආ) රාසුල් ජුගේ චරිතයෙන් ඉස්මතු කෙරෙන යහපත් ගුණාංගය කුමක් ද?

(ii) "එහෙම වුණත් මා නොදන්න දෙයක් තියෙනවා අහන්න
දන්න කෙනෙක් හොයා බලා මට මේ ගැන කියා දෙන්න."
(අ) මේ ප්‍රකාශය කරන්නේ කවරෙක් ද?
(ආ) ඔහු පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නය ඉදිරිපත් කෙරෙන කවි **දෙපදය** ලියන්න.

(iii) "මාලු ටික කපුවන් ගෙනියපුවහම අපේ බඩේ වැලි"
(අ) මේ ප්‍රකාශය ඇතුළත් කතාවේ කතුවරයා නම් කරන්න.
(ආ) මෙහි 'බඩේ වැලි' යන යෙදුමෙන් ප්‍රකාශ කෙරෙන අර්ථය දක්වන්න.

(iv) (අ) ඇන්ටන් චෙකොෆ්ගේ කෘතියක පරිවර්තනයක් සිංහල සාහිත්‍ය සංග්‍රහය පෙළ පොතේ ඇතුළත් වේ. එහි නම කුමක් ද?
(ආ) එහි පරිවර්තකයා නම් කරන්න.

(v) (අ) "කිසාගෝතමියක නොවේ" පැදි පෙළෙහි, මවගේ ළමැදෙහි ගුළි වී සිටියේ කෙබඳු බිලිඳෙක් ද?
(ආ) පද්‍ය නිර්මාණයට අමතරව දයාසේන ගුණසිංහ සිය ප්‍රතිභාව විදහා දැක්වූ තවත් සාහිත්‍යාංගයක් නම් කරන්න.

(vi) පහත දැක්වෙන සාහිත්‍ය කෘති රචනා කෙරුණු රාජධානි යුග නම් කරන්න.
(අ) සද්ධර්මරත්නාවලිය
(ආ) යසෝදරාවත

WWW.OLEVELAPI.COM

(vii) ".... මපුතණුවන්ට සමාධියක් කරන්න."
(අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කිනම් අවස්ථාවක ද?
(ආ) මෙහි 'මපුතණුවන්' ලෙස හැඳින්වෙන්නේ කවරෙක් ද?

(viii) පහත දැක්වෙන ජාතක කථා පදනම් කර ගෙන ලියැවී ඇති කාව්‍ය ග්‍රන්ථ නම් කරන්න.
(අ) සත්තුභත්ත ජාතකය
(ආ) චන්ද කින්නර ජාතකය

(ix) "කැරලුන් මහෝත්සාහයෙන් විද ගත් ගස් සිදුරුවලින් හිරවුන් ප්‍රයෝජන විඳිනා සේ මා රැස් කළ සම්පතින් වුවමනා ප්‍රයෝජන විඳින්නේ බත් බැළයාණෝ ය."
(අ) මේ ප්‍රකාශය කරන්නේ කවරෙක් ද?
(ආ) මේ ප්‍රකාශය රසවත් කිරීමට භාවිත කර ඇති කාව්‍ය අලංකාරය නම් කරන්න.

(x) (අ) 'කිඳුරු වලප' කවි පෙළ රචනා කර ඇති කාව්‍ය ආකෘතිය කුමක් ද?
(ආ) යසෝදරාවත රචනයේ දී භාවිත කර ඇති සුප්‍රකට වෘත්ත නම් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි.)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

i (අ) ලතීෆ් කාශ්මීරි / ලතීෆ් / කාශ්මීර්

(ආ) උදාරත්වය/ අවංකත්වය/ නිහතමානි බව වැනි සුදුසු උත්තරයක් තිබිය යුතු ය.

ii (අ) පියසේන

(ආ) තුනේ ඉඳපු පුංචි බේබි හතරේ පන්තියට ගිහින්

තුනේ ඉඳපු මම හතරට යන්නේ කවදාද ඉතින්

iii (අ) මහාචාර්ය ඒ.වී. සුරවීර

(ආ) බඩගින්නේ සිටීමට සිදු වන බව

ආහාර කිසිවක් නොලැබෙන බව වැනි සුදුසු උත්තරයක් තිබිය යුතු ය.

iv (අ) මගුල් ප්‍රස්තාව

(ආ) යූ.ඒ. ගුණසේකර

v (අ) නොමළ බිළිඳෙකි/ සෙමින් මිය යන බිළිඳෙකි/ පණ අදින බිළිඳෙකි /

(ආ) කෙටිකතා රචනය/ නව කථා පරිවර්තනය/ පුවත්පත් විශේෂාංග හා තීරු ලිපි /

vi (අ) දඹදෙණිය

(ආ) මහනුවර

vii (අ) සාකේත නුවර සිටු දේවියගේ ශීර්ෂාබාධය සුව කළ අවස්ථාව

(ආ) ජීවක වෛද්‍යවරයා

viii (අ) කාව්‍යශේඛරය

(ආ) සඳ කිඳුරු දා කව

ix (අ) ගන්ධක සිටුවරයා

(ආ) උපමාලංකාර

x (අ) සිව්පද ආකෘතිය

(ආ) සමුද්‍රඝෝෂ වෘත්ත/ සමුදුරු ගොස් වෘත්ත

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ප්‍රශ්න අංකය 02**

**අපේක්ෂණය** - 1. නිර්දිෂ්ට පාඨ පිළිබඳ අවබෝධය

2. පාඨයක අදහස තම බසින් ලියා දැක්වීමේ කුසලතාව ඇගයීම

**ලකුණු විග්‍රහය** - **මුළු ලකුණු 20යි (එක් කොටසකට ලකුණු 05 බැගින්)**

තද කළු අකුරින් ඇති එක් එක් වචනයට නිවැරදි තේරුම ලියා ඇත්නම් එක

වචනයකට ලකුණු 01 බැගින් - ලකුණු 02යි

සමස්ත අර්ථයට - ලකුණු 03යි

**2.** පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(i) "පෙර අප දැන ඇඳින
ඉඳිනා හෙයින් නොව වෙන
ගෙයි ඇති **නොපදමින**
කළෙමු වියදම් මොබ තිබූ **දන**"

(ii) "..... ජීවකයන් තමා **වඩාගත්** පවතුත් ඔවුන් ශිල්ප උගත් පරිදිත් **කලණ** වූ ගුණ ඇති පරිදිත් කී ය."

(iii) "**සුදු සක** ලෙසට ඇත් පැටියෙක් විත් යහනේ
සුදු සොඬ ටිකෙන් මගෙ බඩ පිරිමදිති අනේ
**සුදු යම් දෙයක්** සිදු වෙයි මම දුටු සීනේ
සුදසුන් නිරිඳුනේ මොකදැ'යි ඔය සීනේ"

(iv) "...... අපාය නමැති **වඩබාමුඛයෙහි** වැටී **අනයව්‍යසනයට** පැමිණෙන්නා වූ සත්ත්ව සමූහයා සේ ....."

(ලකුණු 05 × 04 = 20 යි.)

i නොපදමින - අග හිඟකම නිසා/ අඩු පාඩු හේතුවෙනි / වියදමක් නැතිව වියදම් කිරීම නිසා. / නාස්තිකාරව.

දන - වස්තුව/ කහවණු/ මුදල්/ ධනය/සල්ලි

පෙර කාලයේ (අතීතයේ) සිට අප වෙනසක් නැතිව හැඳිනගෙන සිටි නිසා ගෙදර ඇති අග හිඟකම් හේතුවෙන් මෙහි තබා තිබූ ධනය වියදම් කළෙමු.

WWW.OLEVELAPI.COM

ii වඩාගත් - ඇති දැඩි කරගත්/ වර්ධනය කරගත්/ හදාවඩා ගත්/ ලොකුමහත් කර ගත්/ පෝෂණය කර ගත්

කල්‍යාණ - යහපත්/ හොඳ/ සිත්ගන්නාසුලු /

ජීවකයින් තමා හදාවඩා ගත් තොරතුරුත් ඔහුගේ ශිල්පය ඉගෙනගත් ආකාරයත්, යහපත් ගති ගුණ ඇති ආකාරයත් පැවසී ය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

| | | | |
|---|---|---|---|
| iii | සුදු සක | - | සුදු පැහැති හක් ගෙඩියක්/ ශ්වේත සංඛයක් |
| | සුදු යම් දෙයක් | - | යහපත් දෙයක්/ හොඳ දෙයක්/ සුබ දෙයක්/ ශුභදායක සිදුවීමක් |

සුදු පැහැති හක් ගෙඩියක ආකාරයේ ඇත් පැටියෙකු යහනට පැමිණ සුදු සොඬෙන් ටිකෙන් ටික අනේ මගේ බඩ පිරි මදියි. සුද්ධෝදන රජතුමනි, ඔය සිහිනය කුමක් ද?

| | | | |
|---|---|---|---|
| iv | වඩබා මුඛයෙහි | - | මුහුදු පතුලේ ඇතැයි සැලකෙන විශාල ගිනි කඳ/ වඩබාග්නිය පටන් ගන්නා තන්හි |
| | අනයව්‍යසනයට | - | නොයෙක් විනාශයන්ට/ අනේක දුක් පීඩාවලට |

අපාය නැමති (නරකාදිය නැමති) මුහුද පතුලේ ඇතැ යි සැලකෙන ගිනි කඳෙහි වැටී නොයෙක් කරදර දුක් පීඩාවලට පත් වන සත්ව සමූහය වගේ

**ප්‍රශ්න අංකය 03**

**ප්‍රශ්න අංක 03 - 07 තෙක්**

**අපේක්ෂණය** - ඇගයීම, ප්‍රකාශනය, භාවිත හැකියාව, විචාර හැකියාව හා රසවින්දන හැකියාව ඇගයීමට ලක් කිරීම

**ලකුණු විග්‍රහය** - 3, 4 ප්‍රශ්න අනිවාර්ය යි. - ලකුණු 15යි

5, 6, 7 ප්‍රශ්නවලින් එකක් පමණක් තෝරා ගත යුතුයි. - ලකුණු 10යි

3, 4 ප්‍රශ්නවල තෝරාගත් ප්‍රශ්නයේ (i) හා (ii) කොටස් වෙන් වෙන්ව විස්තර සහිතව ලියා තිබිය යුතු ය. උදාහරණ දක්වමින් එක් පිළිතුරක් සේ ලියා තිබුණ ද ලකුණු දෙන්න.

| | | | |
|---|---|---|---|
| උදාහරණ 04ට | - | ලකුණු 04යි | ලකුණු 15 යි |
| සමස්ත විස්තරයට | - | ලකුණු 11යි | |

❖ 3, 4 යන ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන 125ක් පමණ තිබීම සෑහේ.

WWW.OLEVELAPI.COM

- **3, 4** යන ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන **125**ක් පමණ තිබීම සෑහේ.

**3.** (i) දිළිඳුකමේ පීඩිත බව හා

(ii) අවංකකමේ යහපත් බව

නිරූපණයට කතුවරයා දක්වා ඇති දක්ෂතාව 'පොළෝ කුහරයෙන් පැමිණි මිනිසා' කෙටිකතාවෙන් එක් කරුණකට නිදසුන් **දෙක** බැගින් දක්වමින් අගයන්න. (ලකුණු 15 යි.)

**නැතහොත්**

සිංහල අලුත් අවුරුදු කාලය

(i) ස්වාභාවික පරිසරය කෙරෙහි හා

(ii) මිනිස් ක්‍රියාකාරකම් කෙරෙහි බලපාන ආකාරය

'වසන්ත සමය' පැදි පෙළෙහි මැනවින් නිරූපිත ය. එක් කරුණකට නිදසුන් **දෙක** බැගින් දක්වමින් විමසන්න. (ලකුණු 15 යි.)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

i දිළිඳුකමේ පීඩිත බව

පොළෝ කුහරයෙන් පැමිණි මිනිසා කෙටිකතාවේ දිළිඳුකමේ පීඩිත බව නිරූපණයට කතුවරයා දක්වා ඇති දක්ෂතා හෙළි වන අවස්ථා කිහිපයක් මෙසේය.

- රාසුල් ජු ගේ බාහිර ස්වරූපය තුළින් මතු වන දළිඳුකම
- කුලී වැඩ කිරීමෙන් සුළු මුදලක් ලැබීම ඇතැම් විට කිසිවක් නොලැබීම
- කිසිදු උගත්කමක් නොමැති වීම නිසා රැකියාවක් නොලැබීම
- යුද ගැටුම් මිනිසා උන්හිටි තැන් අහිමි වී අසරණ වීම
- කුසගින්න නිවා ගැනීමට තරම්වත් ආහාරයක් ඇතැම්විට නොලැබීම

මෙවැනි කරුණු දෙකක්වත් නිදසුන් සහිතව පැහැදිලි කිරීම අවශ්‍ය වේ.

ii අවංකකමේ යහපත් බව

- අවංකකමේ පහපත් බව නිරූපණය කිරීමේ දී පහත සඳහන් කරුණු ගැන අවධානය යොමු කරන්න.
- මුදල් ලබා ගැනීමට වඩා භාරගත් කාර්යය මැනවින් ඉටු කිරීමට රාසුල් ජු උත්සාහ ගැනීම
- සේවයට කැපවීම
- සාධාරණ ලෙස ගාස්තු අය කිරීම
- ඉටු කළ කාර්යයට පෙරළා පැසසුම් අපේක්ෂා නොකිරීම

*නැතහොත්*

i ස්වාභාවික පරිසරය

WWW.OLEVELAPI.COM

වසන්ත සමය පැදි පෙළෙහි එන ස්වාභාවික පරිසරය නිරූපිත අවස්ථා කීහිපයක් මෙසේය.

- එරබඳු, බක්මී, නා ගස්, නෙළුම් මල්වලින් බර වීම
- කුරුල්ලන්ගේ නාදය පැතිර යාම
- මීවදවල පැණි පිරීම
- අඹගස් දලු ලෑම
- මල්වල සුවඳ පැතිරීම
- කජු පුහුලන් කෑමට වවුලන් පැමිණීම



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

ii මිනිස් ක්‍රියාකාරකම්

මෙම කවි පංතියෙන් මතු වන මිනිස් ක්‍රියාකාරකම් කිහිපයක් සඳහන් වේ.

- කජු ඇහිඳීමට දරුවන් ඇදී යාම
- තරුණ තරුණියන් අතර ඇතිවන ප්‍රේම සම්බන්ධතා
- අමනාප වූවන් සමගි වීම
- අලුත් ආහාර පිසීම

ආදි ක්‍රියාකාරකම්වලින් දෙකක්වත් නිදසුන් දක්වා පැහැදිලි කිරීම අපේක්ෂිත ය.

*(උදාහරණ සඳහා ලකුණු 04 යි)*
*(සමස්ත විස්තරයට ලකුණු 11 යි)*
*(මුළු ලකුණු 15 යි)*

**ප්‍රශ්න අංකය 04**

4. (i) අනුප්‍රාස භාවිතය සහ
(ii) එළිසම භාවිතය

සඳ කිඳුරු දා කවෙහි සාර්ථකත්වයට ඉවහල් වී ඇති ආකාරය 'කිඳුරු වලප' ඇසුරෙන් නිදසුන් **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

**නැතහොත්**

(i) තණ්හාව, විනාශය ගෙන දෙන බව හා
(ii) දූරදර්ශී වීම සාර්ථක ජීවිතයකට පදනම වන බව

වේදබ්භ ජාතකය ඇසුරෙන් එක් කරුණකට නිදසුන් **දෙක** බැගින් දක්වමින් පෙන්වා දෙන්න. (ලකුණු 15 යි.)

i සඳකිඳුරු දා කවහෙි සාර්ථකත්වය හේතු වන අනුප්‍රාස භාවිතයට හෙළි වන අවස්ථා මෙසේය

සමාන ශබ්ද එක ළඟ යෙදීම මගින් අපේක්ෂිත අදහස් තීව්‍ර කිරීම

මුව මී පොවා පියා

මන පිනා පියා, මරා පියා

සිහිලැල්ලේයා, පවනැල්ලේයා

සුපුල්වන, එකල්වන, විපුල්වන, තැවුල් වන

පසිද්දේ, පෙම් බැඳැ සැප විඳැ, සොඳිනේ, නොවද්දේ, ලුද්දේ, විද්දේ

සෑම කවියක් පාසා ම සමාන ශබ්ද භාවිත කිරීම මගින් කවියා අනුප්‍රාසය මතු කරයි මෙහිදී නිදසුන් දෙකක් අදාළ කවි මගින් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

ii එළිසමය භාවිතය

මෙහි සෑම කවියක් ම අවසාන වන්නේ සමාන අක්ෂර යෙදීමෙනි. එසේම සෑම කවියක ම ආරම්භයේ දී සමාන අක්ෂර සහිත වචන දක්වේ. ඇතැම් කවිවල මුල, මැද, අග යන ස්ථාන තුනෙහි ම එළිසමය රැකී ඇත.

මේ කරුණු තහවුරු කිරීමට නිදසුන් කවි දෙකක්වත් දක්වා තිබීම අවශ්‍යයයි.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

*නැතහොත්*

i තණ්හාව, විනාශය ගෙන දෙන බව වේදබ්භ ජාතකයෙන් හෙළිවන අවස්ථා කිහිපයක් මෙසේය.

- පෙසෙනකචෝර නම් සොර කණ්ඩායමේ ක්‍රියා කලාපය විනාශයට හේතු වූ බව
- තවත් සොර කණ්ඩායමක් පැමිණ වස්තුව උදුරා ගැනීමට දරන ප්‍රයත්න විනාශය ගෙන දුන් බව
- අවසානයේ දී ඉතුරු වූ සොරුන් දෙදෙනාගේ විනාශයට තණ්හාව හේතු වූ බව
- වේදබ්භ බමුණාගේ විනාශයට ද තණ්හාව හේතු වූ බව වැනි සිදුවීම් දෙකක් නිදසුන් මගින් පැහැදිලි කිරීම ප්‍රමාණවත් වේ.

ii දූරදර්ශී වීම සාර්ථක ජීවිතයකට පදනම් වන බව හෙළි වන අවස්ථා මෙසේය

- සොර කණ්ඩායමට හසු වූ අවස්ථාවේ දී බෝසත් ශිෂ්‍යයා ගුරුවරයාට උපදෙස් දීම
- අන්තේවාසිකයා සොරුන් දමා ගිය වස්තුව තමන්ගේ භාරයට සෘජුව නොගෙන උපායශීලීව ගෙන්වා ගැනීම හා එම වස්තුව පිනට දහමට යෙදවීම

මේ කරුණු නිදසුන් මගින් හෙළි වන ආකාරය පැහැදිලි කිරීම අපේක්ෂිත ය.

*(උදාහරණ සඳහා ලකුණු 04 යි)*
*(සමස්ත විස්තරයට ලකුණු 11 යි)*
*(මුළු ලකුණු 15 යි)*

**ප්‍රශ්න අංකය 05**

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න. උත්තරයක වචන **100**ක් පමණ තිබීම සෑහේ.

5. කථකයාගේ හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා උචිත භාෂා විලාසයක් භාවිත කිරීමට කවියා උත්සුක වී ඇති ආකාරය 'පියසේන ඇසූ ප්‍රශ්නයක්' පැදි පෙළෙන් නිදසුන් **තුනක්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි.)

කථකයාගේ හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා උචිත භාෂා විලාසයක් භාවිත කිරීමට කවියා උත්සුක වී ඇති ආකාරය

- සරල බස් වහර භාවිතය
- කුඩා දරුවන්ට උචිත කට වහර භාවිතය
- පියසේන නම් ළමයා ලවා ම ප්‍රකාශ ලෙස ඉදිරිපත් කිරීම
- දෙපද ආකෘතිය තුළින් හැඟීම් ප්‍රකාශ කිරීම
- ප්‍රශ්න වාචී ස්වරූපයෙන් කවිය නිමවා තිබීම

මෙවැනි කරුණු තුනක් නිදසුන් සහිතව පෙන්වා ඇත්නම් සාර්ථක පිළිතුරක් සේ පිළිගන්න.

*(උදාහරණ සඳහා ලකුණු 03 යි)*
*(සමස්ත විස්තරයට ලකුණු 07යි)*
*(මුළු ලකුණු 10 යි)*

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ප්‍රශ්න අංකය 06**

6. "යහපත් සිතින් සුළු දෙයක් දන් දීමෙන් පවා ඉතා විශාල ප්‍රතිලාභ ලැබිය හැකි බව 'උත්තරෝලිය වස්තුවෙන්' පෙන්වා දෙයි." නිදසුන් **තුනක්** සහිත ව පහදන්න. (ලකුණු 10 යි.)

යහපත් සිතින් සුළු දෙයක් දන් දීමෙන් පවා ඉතා විශාල ප්‍රතිලාභ ලැබිය හැකි බව උත්තරෝලිය වස්තුවෙන් පෙන්වා දෙයි.

- තමාගේ ආහාරයට තිබූ පිළිණි කටු අලය භක්තියෙන් පූජා කිරීම
- දෙවන ආත්මයේ මවුකුස සිටිය දී ම උතුරාලූ වැවේ ඔහු වෙනුවෙන් නිධානයක් පහළ වීම
- නිධානයෙන් ලැබෙන සම්පත් ඔහුගේ අවශ්‍යතා සඳහා පමණක් යෙදවීමට හැකි වීම
- තමා කළ කුශලයෙන් ලද වස්තුව දෙවියන්ට, රජුන්ට පවා උදුරාගන්නට හෝ නසා දමන්නට නොහැකි වීම
- රජුගේ ප්‍රසාදය හිමිවීම හා ගම්වර, දාස දාසීන් ආදිය ලැබීම
- දෙව් ලොව ඉපදීම

මෙයින් උදාහරණ තුනක් ඉදිරිපත් කර තිබේනම් සාර්ථක පිළිතුරක් සේ පිළිගන්න.

*(උදාහරණ සඳහා ලකුණු 03 යි)*
*(සමස්ත විස්තරයට ලකුණු 07යි)*
*(මුළු ලකුණු 10 යි)*

**ප්‍රශ්න අංකය 07**

7. "ප්‍රබල නාට්‍යමය අවස්ථා ගොඩනැංවීම සාර්ථක නාට්‍යයක ලක්ෂණයකි." 'මඟුල් ප්‍රස්තාව' නාට්‍යයෙන් නිදසුන් **තුනක්** දක්වමින් තහවුරු කරන්න. (ලකුණු 10 යි.)

ප්‍රබල නාට්‍යමය අවස්ථා ගොඩනැංවීම සාර්ථක නාට්‍යයක ලක්ෂණයකි.

මගුල් ප්‍රස්තාව නාට්‍යයෙහි,

- ලව්නේරිස්, තෙපානිස් හමුවීමට පැමිණි කාරණය කීමට උත්සාහ දරන අවස්ථාව
- ලව්නේරිස් පැමිණි කාරණය නොදන්නා නන්දාවතී ඔහු හමුවට පැමිණි අවස්ථාව
- ගෝනහේන ඉඩමේ උරුමය ගැන මත ගැටෙන අවස්ථාව
- තෙපානිස් හා නන්දාවතී විසින් ලව්නේරිස් නිවසින් බැහැර කරන අවස්ථාව
- ලව්නේරිස් පැමිණි කාරණය නන්දාවතී දැන ගත් අවස්ථාව
- හඳයාත් වල්ලියාත් ගැන නන්දාවතී, ලව්නේරිස් හා තෙපානිස් අතර ඇති වන සංවාදය

ආදි නිදසුන් අවස්ථා තුනක් දී ඇත්නම් සාර්ථක පිළිතුරක් සේ සලකන්න.

*(උදාහරණ සඳහා ලකුණු 03 යි)*
*(සමස්ත විස්තරයට ලකුණු 07යි)*
*(මුළු ලකුණු 10 යි)*

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....